# වියුක්ත බල්ලා

සරල රේඛාව ඉන්ද්‍රිය ගෝචර නොවේ යැයි කී විට ඇතැමුන්ට ඒ ප්‍රශ්නයක් වනු ඇත. එසේ නම් සරල රේඛා නොමැති දැයි කිසිවකු විසින් ප්‍රශ්න කරනු ලැබීමට ඉඩ ඇත. අප සරල රේඛා නමින් හොඳින් දන්නා දේ ඉන්ද්‍රිය ගෝචර නොවන්නේ කෙසේ ද යන්න තේරුම් ගැනීම ඔවුන්ට ප්‍රශ්නයක් වීමට ඉඩ ඇත. ඒ අතර ඇතැමකු ප්‍රීතියට පත්වනු ඇත්තේ ජාතිය යන්න ද ඉන්දිය ගෝචර නොවේ යැයි සඳහන් කළ විට ය. ඉන්ද්‍රිය ගෝචර නොවේ නම් ජාතියක් නැතැයි යන්න තහවුරු වන්නේ ය යන්න ඔවුන්ගේ නිගමනය වනු ඇත.

වැඩි දුර යෑමට පෙර මෙය පැහැදිලි කර ගත යුතු ය. ඉහත සඳහන් ප්‍රශ්නවල හා නිගමනවල පටලැවිලි රාශියක් වෙයි. පළමුවෙන් ම යමක් පවතින්නේ ය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න ය. ඇතැමුන්ට යමක් සත්‍ය වන්නේ එනම් පවතින්නේ (සත්බව යනු පැවතීම ය) ඒ ඉන්ද්‍රිය ගෝචර නම් ය. ඉන්ද්‍රිය ගෝචර දෑ පමණක් ප්‍රත්‍යක්‍ෂ වන බැවින් ඉන්ද්‍රිය ගෝචර නොවන දෑ පිළිබඳ අවිශ්වාස ඇතිකර ගැනීමට ඇතැම් දෙනා පෙළඹෙති. ඉන්ද්‍රියානුභූතවාදය (positivism) නමින් හැඳින්වෙන දර්ශනයෙහි පදනම ද එය වෙයි.

ඉන්ද්‍රිය ගෝචර නොවන දෑ ප්‍රත්‍යක්‍ෂ නොවන බැවින් එවැනි දෑහි පැවැත්ම අපට ඇතැම් විට තර්කණය අනුසාරයෙන් නිගමනය කිරීමට සිදුවෙයි. එවිට එහි පැවැත්ම දැනගැනීමට ඉන්ද්‍රියට අමතර ව තවත් යමක් අපට අවශ්‍ය වෙයි. මෙය ගැටළු සහගත බව ඇතැම් ඉන්ද්‍රානුභූතවාදීන්ගේ මතය වෙයි. එහෙත් තර්කානුසාරී ඉන්ද්‍රියානුභූතවාදීන්ට (logical positivists) එය ගැටළුවක් නො වෙයි. එසේ වුවත් තර්කණය යම් න්‍යායක් මත පදනම් වෙයි. න්‍යාය ඉන්ද්‍රිය ගෝචර නොවන බව ඇතැමුනට නො වැටහෙයි.

වියුක්ත ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප නොමැතිව අපට න්‍යායක් (logic) නැත. A= B හා B = C නම් A =C යැයි අපි කියමු. එහෙත් එය වියුක්ත ප්‍රකාශනයකි. මෙහි A, B හා C යනු කවරේ ද? ඒවා ඉරටු කැලි හෝ වස්තුවල ස්කන්ධ හෝ වෙනත් දිගක් පළලක් ඝනකමක් ස්කන්ධයක් ඇති ද්‍රව්‍ය නොව වියුක්ත සංකල්ප ය. මිනිසුන් A= B හා B = C නම් A = C යන්න ලබාගෙන ඇත්තේ සාධාරණය කිරීමෙනි (generalizing). ඉරටු කැලි දෙකක් දිගින් තවත් ඉරටු කැල්ලකට සමාන වේ නම්, එවිට ඒ ඉරටු කැලි දෙක ද දිගින් එකිනෙකට සමාන වෙයි. දිගින් පමණක් නොව පළලින්, ස්කන්ධයෙන් ආදී වශයෙන් සමාන වන වස්තු අරභයා ද ඒ ප්‍රතිඵලය වලංගු වෙයි. A, B හා C යනු ඉරටු කැලි වැනි වස්තු නොව එවැනි වස්තු සාධාරණීකරණයෙන් ලබාගන්නා වියුක්ත සංකල්ප ය.

ඉන්ද්‍රිය ගෝචර වස්තු සාධාරණීකරණයෙන් ලැබෙන්නේ තවත් ඉන්ද්‍රිය ගෝචර සංයුක්ත සංකල්ප නොව ඉන්ද්‍රිය ගෝචර නොවන වියුක්ත සංකල්ප ය. ඉහත සඳහන් A, B හා C පමණක් නොව සරල රේඛාව ද වියුක්ත සංකල්පයකි. අපි පළලට හෝ ඝනකමට හෝ වඩා විශාලත්වයෙන් ඉතා වැඩි දිගක් සහිත ඇද නැති රේඛා සාධාරණීකරණයෙන් දිගක් මිස පළලක් හෝ ඝනකමක් හෝ නැති වියුක්ත සරල රේඛාව ලබා ගන්නෙමු. එපමණක් නො වෙයි. අද සිංහලයෝ මිනිසා (man) යන වචනය වියුක්ත ව යොදා ගනිති. ඊනියා මානව අයිතිවාසිකම් ගැන කතාකරති. එහෙත් මේ මානව අයිතිවාසිකම් ඇත්තේ වියුක්ත මානවයාට යන්න ඔවුන්ට, විශේෂයෙන් ම නීතිඥයන්ට අමතක වෙයි.

ඉංගිරිසියෙහි මේ වියුක්ත සංකල්පය හැඳින්වීම එතරම් ගැටළුවක් නොවන්නේ ඒ සඳහා එහි වෙන ම රූපයක් ඇති බැවිනි. අපි බල්ලා (dog) යන වචනය ගනිමු. ඉංගිරිසියෙන් ඩෝග් - dog, ද ඩෝග් - the dog හා අ ඩෝග් - a dog යනුවෙන් වෙන ම රූප තුනක් වෙයි. ද ඩෝග් - the dog නම් දෙවැනි රූපයෙන් කියැවෙන්නේ අප දන්නා නිශ්චිත බල්ලකු ගැන ය. අපේ ගෙදර බල්ලා, නැන්දලාගේ බල්ලා ආදී ප්‍රකාශවල යෙදෙන්නේ මේ නිශ්චිත බල්ලා ය. අ ඩෝග් - a dog යන්නෙන් කියැවෙන්නේ බල්ලකු ගැන ය. ඒ අප නොදන්නා බල්ලකු ගැන කියන විට යොදා ගැනෙන රූපයයි. ඊයෙ මට පාරෙදි බල්ලකු බුරාගෙන පැන්නා යැයි කීවිට ඒ බල්ලා ගැන මා නොදන්නා බව ප්‍රකාශ වෙයි. එහෙත් ඌ බල්ලකු මිස නරියකු නොවන බව මා දන්නා බව ද ඉන් ගම්‍ය වෙයි.

© Prof. Nalin De Silva

ද ඩෝග් - the dog හා අ ඩෝග් - a dog සඳහා එලෙස තේරුම් තිබුණ ද, ද ඩෝග් - dog යන්නෙන් කියැවෙන්නේ කුමක් ද? ඩෝග් - dog යනු නැන්දලාගේ බල්ලා මෙන් දන්නා බල්ලකුවත් බුරාගෙන පැමිණි බල්ලා මෙන් නොදන්නා බල්ලකුවත් නො වේ. ඒ සියළු බල්ලන්ගේ සාධාරණීකරණයයි. ඒ ඉන්ද්‍රිය ගෝචර බල්ලෙක් නො වෙයි. ඩෝග් - dog යන්න වියුක්ත සංකල්පයක් වෙයි. සිංහලයෙහි ඒ සඳහා වචනයක් (රූපයක්) නැත. සිංහල නාම පදවල ඒකවචන රූපයෙහි වියුක්ත බවක් නැත. යම් වියුක්ත බවක් ඇත්නම් ඒ නාම පදයෙහි ධාතුවෙහි ය. ධාතුව ඇතැම් විට බහු වචන රූපය ගනියි. අපි උදාහරණයක් ගනිමු. බලු වලිගය යැයි කී විට ඉන් ප්‍රකාශ වන්නේ වියුක්ත බල්ලකුගේ වලිගය ය. මෙහි බලු ධාතුව බහු වචන රූපය නොගත්ත ද අලි වලිගය කී විට අලි යන්න බහු වචන රූපය වෙයි. පුටු කකුල යන්නෙහි පුටු ධාතුව ද බහු වචන රූපය ගනියි. පුටු කකුල යන්නෙන් කියැවෙන්නේ ද වියුක්ත පුටුවක කකුල ය. මේ අවස්ථාවන්හි දී බලු, අලි, පුටු යන ධාතු විශේෂණ පද ලෙස ද යෙදෙයි.

එහෙත් ඉංගිරිසියෙහි එසේ නො වෙයි. එහි විශේෂණ පදය ඒකවචන රූපය ගනියි. ඉංගිරිසියෙහි මාක් ලිස්ට් - Mark List මිස මාක්ස් ලිස්ට් - Marks List යනුවෙන් නො යෙදෙයි. ඒ සිංහලයෙහි ලකුණු ලැයිස්තුව ලෙස මිස ලකුණ ලැයිස්තුව යනුවෙන් නො යෙදෙයි. මේ සියල්ලෙන් කියැවෙන්නේ සිංහලයෙහි වියුක්ත ඒක වචන නාම පදයක් නැති බව ය. අපේ රටේ චින්තනයෙහි වියුක්ත බව අඩුවීම සමග මෙය බැඳී ඇතැයි සිතිය හැකි ය. එහෙත් ඉංගිරිසියෙහි ඒක වචන වියුක්ත නාම පද තිබෙන අතර විශේෂණය බොහෝ විට ඒක වචන රූපය ගනියි.

අද සිංහලයෙහි මිනිසා යන වචනය වියුක්ත නාම පදය ලෙස ලියනු පෙනෙන්නට ඇත. මිනිසාට වාතය හා ජලය අවශ්‍ය වේ යැයි අද සිංහලයෙහි කියැවෙයි. මේ ජලය හා වාතය අවශ්‍ය වන්නේ අප දන්නා යම් මිනිසකුට හෝ නිශ්චිතව නොදන්නා මිනිසකුට නොව පොදුවේ මිනිසාට ය. එනම් සාධාරණීකරණයට ලක් වූ වියුක්ත මිනිසකුට මෙහි දී මිනිසා යන්න යොදා ගැනෙයි. එහෙත් මෙවැනි සම්ප්‍රදායක් පෙර නොතිබෙන්නට ඇත. එදා එවැන්නක් ප්‍රකාශ කරන්නට ඇත්තේ මනුෂ්‍ය වාසයට, මිනිස් වාසයට ජලය හා වාතය අවශ්‍ය වේ යනුවෙන් විය හැකි ය. එකල වියුක්ත නාම නොතිබුණු අතර අවශ්‍ය අවස්ථාවන්හි දී වියුක්තය බහු වචන රූපය ගත් විශේෂණ පදවලින් ප්‍රකාශ කෙරෙන්නට ඇතැයි සිතිය හැකි ය. යමකුට පැරණි පොත පත ඇසුරෙන් මේ පිළිබඳ අධ්‍යයනයක් කළ හැකි ය.

සිංහලයෙහි වියුක්ත සංකල්ප ප්‍රකාශ කිරීම ඉංගිරිසියෙහි එසේ කරනවාට වඩා අමාරුවන්නේ ඒ සඳහා ඒකවචන නාම පදයක් නොමැතිවීම හේතුකොටගෙන යැයි සිතිය හැකි ය. ඒ එසේ වුවත් සිංහලයන්ට, විශේෂයෙන් ම සිංහල බෞද්ධයන්ට සත්බව පිළිබඳ ගැටළුවක් තිබිය හැකි නො වේ. එයට හේතුව සංයුක්ත හෝ වියුක්ත හෝ පැවැත්ම සාපේක්ෂ වුවක් බැවිනි. සත්බව අපේ මනසේ නිර්මාණයක් මිස මනසෙන් ස්වායත්ත වූවක් නො වෙයි. හුදු ඉන්ද්‍රියානුභූතවාදීන්ට වියුක්ත සංකල්පවල පැවැත්ම තේරුම් ගැනීම අපහසු වන්නේ ඔවුන්ගේ ලෝකවල ඉන්ද්‍රිය ගෝචර සංකල්පවලට මිස ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්පවලට පැවැත්මක් නොමැති බැවිනි. ප්‍රත්‍යක්ෂයෙන් ගත නොහැකි දෙවැනි ගණයේ සංකල්පවල පැවැත්ම තර්කානුසාරයෙන් නිගමනය කිරීමට ඔවුහු මැළි වෙති. එහෙත් තර්කානුසාරි ඉන්ද්‍රියානුභූතවාදීන්ට ඒ ප්‍රශ්නය ඒ ආකාරයෙන් පැන නො නගියි. එයට හේතුව ඔවුන් පැවැත්ම පිළිබඳ ප්‍රශ්නයේ දී තර්කණය ද පිළිගැනීමට සූදානම් බැවිනි.

අප කලින් දුටු පරිදි තර්කණයෙහි ද යෙදෙන්නේ වියුක්ත සංකේත ය. හුදු ඉන්ද්‍රියානුභූතවාදීන්ට නම් ඒ වියුක්ත සංකේත පවා පිළිගැනීමට නො හැකි ය. ඔවුන්ට ඉරටු කැලි දෙකක් දිගින් සමාන බව කිවහැකි නමුත්, එනම් ඒ පිළිගත හැකි නමුත්, වියුක්ත සංකේත ලෙස ගනිමින් A = B බව පිළිගත හැකි නො වෙයි. හුදු ඉන්ද්‍රියානුභූතවාදියකුට සරල රේඛාවක් නො පවතියි. ඒ දිගක් පමණක් ඇති පළලක් හෝ ඝනකමක් හෝ නොමැති සරල රේඛාවක් ප්‍රත්‍යක්ෂ කරගත නොහැකි බැවිනි. එහෙත් තර්කානුසාරී ඉන්ද්‍රියානුභූතවාදියකුට සරල රේඛාවක පැවැත්ම පිළිගත හැක්කේ ඔහුගේ ලෝකයෙහි සාධාරණීකරණය වලංගු බැවිනි.

ඊනියා යථාර්ථවාදියකුට සරල රේඛාවක පැවැත්ම ප්‍රශ්නයක් නොවන්නේ මොන තරම් පාරම් බැවත් ඔවුන් තරම් විශ්වාසය මත පදනම්වන වෙනත් පිරිසක් නොමැති බැවිනි. ඊනියා වාස්තවික යථාර්ථවාදියකුට අනුව ඔහු ඇතත් නැතත් ඔහුගෙන් බාහිරව ලෝකයෙහි සරල රේඛා පවතියි. ගණිත ලෝකයෙහි එවැනි රේඛා පවතින බව ඔහු කියනු ඇත. එහෙත් ගණිත ලෝකයෙහි එවැනි රේඛා ඇති බව ඔහු දැනගන්නේ කෙසේ ද? ඔහු එවැනි රේඛා ඇති බව

© Prof. Nalin De Silva

පිළිගන්නේ ගණිතඥයන් කෙරෙහි ඇති විශ්වාසය නිසා මිස වෙනත් හේතුවක් නිසා නො වෙයි. සාධාරණීකරණයෙන් ලැබෙන සංකල්ප ඇති බව, පවත්නා බව දැනගැනීමට යථාර්ථවාදියකුට ඇති සාධක කවරේ ද?

අපට සාධාරණීකරණයෙන් ලැබෙන්නේ වියුක්ත සංකල්ප ය. ඒ ඉන්ද්‍රිය ගෝචර නො වෙයි. සංයුක්ත වේවා වියුක්ත වේවා . සංකල්ප සියල්ල මනසේ නිර්මාණ වෙයි. සිංහල බෞද්ධයනට ඒ ප්‍රශ්නයක් නො වෙයි. එහෙත් යථාර්ථවාදියාට මෙහි දී මනස උපකාර නො වෙයි. ඔහු පවතින්නේ යැයි කියන සියල්ල මනසින් තොරව පවතියි. ප්‍රශ්නය වන්නේ සරල රේඛා පවතින්නේ කොහේ ද යන්න ය.

යථාර්ථවාදියාට ඇද නැති කෝටුවක් පෙන්විය හැකි ය. ඔහු කළ යුත්තේ කිනම් හෝ කෝටුවක් ගෙන එහි ඇද නැති කිරීම ය. පිහියක් හෝ වෙනත් ආයුධයක් හෝ භාවිතයෙන් ඔහුට ඒ කළ හැකි ය. එහෙත් ඔහු සරල රේඛාවක් පෙන්වන්නේ කෙසේ ද? කඩදාසියක සරල රේඛාවක් ඇඳිය නොහැකි දැයි යමකු ඇසීමට ඉඩ ඇත. එහෙත් කිසිවකුට කඩදාසියක සරල රේඛාවක් ඇඳිය නො හැකි ය. කෙතරම් හීන් තුඩක් සහිත පැන්සලකින් ඇන්ද ද එසේ අඳිනු ලබන රේඛාවට ඝනකමක් වෙයි. ඒ ඝනකම මුළුමනින් ම නැති රේඛාවක් කඩදාසියක ඇඳිය හැකි නො වෙයි. එසේ නම් අප යථාර්ථවාදියා සරල රේඛාවක් පවතින බව පෙන්වන්නේ කෙසේ ද? ඔහු එලෙස සරල රේඛාවක් මනසින් ස්වායත්තව ඇති බව ද පෙන්විය යුතු ය. එසේ නැත්නම් ඔහුට සිදුවනු ඇත්තේ සරල රේඛා, ත්‍රිකෝණ ඇතුළු ජ්‍යාමිතිය නැති බව පිළිගැනීමට ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva